**290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු

අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 2.2(ඇ) | වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායමේ නිරවද්‍යතාවය පරීක්ෂාව | 2.1 |
| 3.1.2(අ) | ජලය කාන්දුවීමක් නිසා සිදු වී තිබුණු හානිය දෙපාර්තමේන්තු හානි පාඩු ලේඛනයේ ඇතුළත් කර නොතිබීම. | 3.3 |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

**(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 නොවැම්බර් 11 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ ඡේද අංක 7.7 ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මුදල් හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන ඍජු ක්‍රමය යටතේ පිළියෙල කළ යුතු වුවත්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල් පදනම මත සකස් කර තිබුණි. | අත්තිකාරම් ගිණුම් වල දෙපාර්තමේන්තු අතර ණය ශේෂ මාරු කිරීමේදී ශේෂ පිරික්සුමට වන ශුද්ධ බලපෑම ශුන්‍ය වන බැවින් හර ශේෂය රු.19,999,828.00 ක් සහ බැර ශේෂය 23,659,038.00 ක් ලෙස දක්වන ලදී.ඔබ විසින් දක්වන ලද අගයන් යොදා ගත්තද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වෙනසක් සිදු නොවේ. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) තැන්පතු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අංක 6000-0-0-16-0-47 දරන තැන්පතු ගිණුමේ කාල විශ්ලේෂණය අනුව වර්ෂ 2 ත් 5 ත් අතර රු.3,043,559 ක තැන්පතු සහ වර්ෂ 5 ට වැඩි රු.346,063 ක තැන්පතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විටත් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි. | තැන්පතු ගිණුමේ ඇති වසර දෙකට වඩා කල් ගත වූ තැන්පතු සම්බන්ධයෙන් අදාල රුඳවුම් මුදල් නිදහස් කිරීමට ඇති හැකියාව විමසා අදාල පාර්ශවයන් වෙත දැනුවත් කිරීමට කටයුතු කර ඇත.ඒ සඳහා පිළිතුරු ලද වහාම එම මුදල් නිදහස් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන ලෙසට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | වර්ෂ 02 ඉක්මවූ තැන්පතු ආපසු ගෙවීමට හෝ හිමිකම් නොපාන්නේ නම් එම ශේෂ රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | අංක 6000-0-0-13-0-64 දරන තැන්පතු ගිණුමේ කාල විශ්ලේෂණය අනුව වර්ෂ 2 ත් 5 ත් අතර රු.17,176,464 ක තැන්පතු හා වර්ෂ 5 ට වැඩි රු.8,026,493 ක තැන්පතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විටත් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තව ද තැන්පතු ගිණුමට සටහන් කිරීමේ දී විස්තරය පැහැදිලිව සටහන් කිරීම වෙනුවට පෞද්ගලික නමින් හෝ දිස්ත්‍රික් ධීවර කාර්යාලවල නමින් මුදල් තැන්පත් කර තිබූ බව සඳහන් කිරීම නිසා මුදල් තැන්පත් කිරීමට අදාළ කාරණය නිශ්චිතව හඳුනාගැනීමට නොහැකි විය. | වර්ෂ 5ට වඩා කල් ගත වූ රු.8,026,493 ක තැන්පතු ශේෂවලින් රු.205,989 ක් 2024 මාර්තු මස රාජ්‍ය ආදායමට බැර කරන ලදී. | දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කළ යුතු අතර වර්ෂ 2 ඉක්මවූ තැන්පතු ආපසු ගෙවීම හෝ හිමිකම් නොපාන්නේනම් එම ශේෂ රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. එමෙන්ම මුදල් තැන්පත් කිරීමට අදාළ කාරණය නිශ්චිතව සඳහන් කළ යුතුය. |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දියවර දිරිය ණය යෝජනා ක්‍රමයේ රජය වෙනුවෙන් පොලී සහනාධාරය ගෙවීම සහ නියාමනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත බලය පවරා තිබුණ ද, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම ලබාගෙන තිබූ එක් එක් ධීවරයා ණය ලබාගත් දිනය, ණය වාරික ගෙවා අවසන් වන දිනය, මාසිකව ගෙවිය යුතු පොලී සහනාධාර ආදී ගෙවීම් විස්තර වෙන වෙනම හඳුනාගැනීමට හැකිවන පරිදි ලේඛන හෝ දත්ත ගොනුවක් පවත්වා ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ රු.11,996,398 ක මුදල ද ඇතුළුව වසර 12 ක වැඩි කාලයක් තුළ ලංකා බැංකුවට ගෙවා තිබෙන රු.මිලියන 300 කට වැඩි පොලී සහනාධාරයේ නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි වූ අතර මේ දක්වා ගෙවා තිබෙන පොලී සහනාධාර මුදල නිවැරදිව ගණනය කිරීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තු විසින් ණය හිමියන්ගෙන් ණය වාරික අයවීම, නොපියවා තිබෙන ශේෂ සම්බන්ධයෙන් | දියවර දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ සිටින සියලුම ණයලාභීන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගොස් නොමැති අතර එමගින් ඇති වූ ගැටළු සහගත තත්වය නිරාකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව මේ වන විට පියවර ගෙන ඇත. මේ අනුව හඳුනාගත් ණය හිමියන්ගේ හිඟ වාරික සහ ණය මුදල් අයකර ගැනීම කඩිනමින් සිදුකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් පොලි සහනාධාර මුදල් ලංකා බැංකුව වෙත ගෙවීම තාවකාලිකව අත්හිටුවීම, දෙපාර්තමේන්තුව මඟින් ණය හිමියන් දැනුවත් කරමින් අවවාදාත්මක ලිපි යැවීම, | ණය යෝජනා ක්‍රමය පිළිබඳ නිවැරදි තොරතුරු පවත්වා ගත යුතු අතර ඉල්ලුවිට දී එම තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | |
|---|---|
| තොරතුරු ඇතුළත් ලේඛන හෝ දත්ත පද්ධතියක් පවත්වාගෙන නොයාම නිසා පොලී සහනාධාරය ගෙවීමට ඉතිරිව තිබෙන ණය මුදල, ගෙවීමට තිබෙන පොලීය, සහ ගෙවා අවසන් කළ ණයකරුවන් කවුරුන් ද යන්න හඳුනාගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ බැවින් මෙම ගණුදෙනුවේ නිරවද්‍යතාවය තහවුරු නොවීය. කෙසේ වෙතත් බැංකු ලේඛන අනුව 2023 දෙසැම්බර් 31 දිනවන විට ලබා දී තිබූ ණය ශේෂය රු.776,515,188 ක් විය. | සියලු දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කරමින් ක්ෂේත්‍ර නිලධාරීන් හරහා ණය හිමියන් දැනුවත් කිරීම, ලංකා බැංකුවෙන් අදාල ණය ලාභීන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනීම හා ණය හිමියන් සමග එළඹ ඇති සම්මුතීන් පිළිබඳ කරුණු ලබා ගැනීමට පියවර ගෙන ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 24 දිනැති අංක 2255/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් බලපත්‍ර ගාස්තු අයකිරීමේ නියෝග ප්‍රකාරව ප්‍රධාන ක්‍රියාකාරකම් 05 යටතේ බලපත්‍ර ලබාදිය හැකි අවස්ථා 53 ක් සඳහා රාජ්‍ය ආදායම් එකතුකිරීම සඳහා ගාස්තු පැනවීමට අදාල නියෝග අමාත්‍යාවරයා විසින් නිකුත් කර තිබුණි. කෙසේ වෙතත් බලපත්‍ර නිකුත් කිරීමේ දී පූර්ව අංකනය කිරීමක් සහිත විශේෂිත කඩදාසියක බලපත්‍ර නිකුත් නොකිරීම නිසා රජයට ආදායමක් නොමැතිව බලපත්‍රයක් නිකුත්වීමට අවස්ථාවක් තිබෙන අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එකතුකර තිබූ රු.179,170,315 ක වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායම නිකුත් කර තිබූ සියලුම බලපත්‍රවලට අදාල ආදායම බව සැසඳීමට නොහැකිවීම නිසා ඉහත සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායමේ නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේ දී සෑහීමකට පත්විය නොහැකි විය. | 2021 නොවැම්බර් 24 දිනැති අංක 2255/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් බලය ලබා දී ඇති ආකාරයට අවස්ථා 53 ක් යටතේ ආදායම් රැස් කිරීම සිදු කරනු ලබයි.එම රැස්වන ආදායමට අදාල බලපත්‍ර නිකුත් කිරීම කළමනාකරණ අංශය , තත්ව පාලන අංශය , සංවර්ධන අංශය හා මෙහෙයුම් අංශය මගින් සිදු කරනු ලබන අතර අප දෙපාර්තමේන්තු බැංකු ගිණුමට රැස් වන මුදල, එක් එක් අංශයෙන් නිකුත් කරන බලපත්‍ර ප්‍රමාණය සමඟ මාසික සැසඳීම සිදු කරනු ලබයි.2024 වර්ෂයේ සිට දෙපාර්තමේන්තු ආදායම් රැස් කිරීම online ක්‍රමයට සිදුවන බැවින් ආදායම බැංකුවට ලැබුණු බව තහවුරු කරගෙන බලපත්‍ර නිකුත් කරයි.එම නිසා නිකුත් කර ඇති බලපත්‍ර වලට අදාලව රැස්කරන ආදායම පහසුවෙන් සැසඳීමේ හැකියාව පවතී. | බලපත්‍ර නිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය. |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| මුදල් රෙගුලාසි 756(6) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී භා.භා.ග.ප 66 හි පවතින ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව දෙපාර්තමේන්තුවේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු ජුනි 30 ට පෙර අවසන් කල යුතු වුවත් රටේ පැවති අයහපත් ආර්ථික තත්වය නිසා දිස්ත්‍රික් කාර්යාල 15 න් දිස්ත්‍රික් කාර්යාල 6ක පමණක් අපහරණ කටයුතු සිදු කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාර අතිරික්තතා හා ඌනතා සම්බන්ධව කටයුතු කළ යුතුය. |

**2.3 බැංකු ගිණුම් මෙහෙයවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට හඳුනානොගත් ලැබීම්වල වටිනාකම රු.1,344,682 ක්වූ අතර ඉන් රු.523,606 ක් ලැබීම් 13 ක් මාස 02 සිට 06 දක්වා හඳුනානොගත් ලැබීම්වලින් සමන්විත වූ අතර 2024 මාර්තු 31 දින වනවිට මාස 02 සිට 06 දක්වා වූ රු.195,500 ක ලැබීම් 07 ක් තවදුරටත් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හඳුනානොගත් ලැබීම් තුල අන්තර්ගත රු.195,500.00 ක මුදල සෘජුවම බැංකුගත කරන ලද ලැබීම් වන අතර එම ලැබීම් හඳුනා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ 2024.05.20 දිනැති ලිපිය මගින් ආදායම් රැස් කරන අංශ වල ප්‍රධානීන්ගෙන් විමසීම් කරන ලදී.ඒ අනුව ඉදිරියේදී හඳුනා ගැනීමට කටයුතු කෙරේ. | හඳුනා නොගත් ලැබීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යසාධන දර්ශක ලෙස ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් දෛනිකව සිදුකරනු ලබන කාර්යභාරයන් 76 ක් දක්වා තිබූ අතර, ඒවායේ අපේක්ෂිත හා සත්‍ය නිමවුම සංඛ්‍යාත්මකව හඳුනාගෙන නොතිබුණි. | කාර්යසාධන දර්ශක වල අපේක්ෂිත හා සත්‍ය නිමවුම සංඛ්‍යාත්මකව හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී. | කාර්යසාධනය ගණනය කළ හැකි දර්ශක හඳුනාගත යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය වෙත ALDFG හා PELAGIKOS යන ව්‍යාපෘති වලින් ලැබී තිබු ටැබ් යන්ත්‍ර 161 ක ප්‍රමාණයෙන් මීගමුව දිස්ත්‍රික් කාර්යාලය වෙත 16 ක් ලබා දී තිබුණි. කාර්යාලීය නිලධාරීන් වෙත මෙම ටැබ් යන්ත්‍ර බෙදා දී තිබු අතර, එම ටැබ් යන්ත්‍ර පොදු 47 බඩු වට්ටෝරු පොතට නිවැරදිව ඇතුළත් කර නොතිබු අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ දී උක්ත ටැබ් යන්ත්‍ර 16 සමීක්ෂණයට භාජනය වී නොතිබුණු බැවින් මෙම ටැබ් යන්ත්‍රවල පැවැත්ම තහවුරු නොවීය. | මීගමුව දිස්ත්‍රික් ධීවර කාර්යාලයට ලබා දී ඇති ටැබ් යන්ත්‍ර 16 එම දිස්ත්‍රික් ධීවර කාර්යාලයේ පොදු 44 භාණ්ඩ වට්ටෝරු ලේඛනයට ඇතුලත් කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී.මෙම ටැබ් යන්ත්‍ර අදාල නිලධාරීන් භාරයේ තිබෙන බැවින් භාණ්ඩ සමීක්ෂනයටද භාජනය වී නොමැත. | දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛනවලට ඇතුළත් කළ යුතු අතර එම සියළුම ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම(i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් රු.16,519,961 ක අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ 06 වන මහලේ ජලය කාන්දු වීමක් නිසා සිදු වූ හානිය දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන හානි හා පාඩු ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණි. මේ අනුව මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබූ අතර අලාභයට වගකිව යුතු පාර්ශව පැහැදිලිව හඳුනාගෙන තිබුණ ද රජයට සිදු වී තිබුණ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අලාභය සම්බන්ධයෙන් මු.රෙ.104 පරීක්ෂණයක් සිදු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් ලබා දුන් උපදෙස් අනුව කමිටුව පත් කර මු.රෙ.104 පරීක්ෂණයක් සිදු කරන ලදි. අමාත්‍යාංශ සමාලෝචන කමිටුව හරහා මු.රෙ.104 කමිටුව විසින් තක්සේරු කරන ලද හානිය සම්බන්ධයෙන් නිර්දේශ ලබා දුන් පසු හානි පාඩු ලේඛනයට ඇතුළත් කළ හැකි ය. අමාත්‍යාංශ නිර්දේශය තවමත් දෙපාර්තමේන්තුව වෙත ලබා දී නොමැති බව වැඩිදුරටත් දන්වමි. | පාඩු හානි ලේඛනය යාවත්කාලීන පවත්වාගෙන යා යුතුය. |

## 3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ (ඉ) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුකළ යුතු වුවත් 2023 වර්ෂය සඳහා නිකුත් කර තිබුණු විගණන විමසුම් 8 කට 2024 අගෝස්තු 12 දිනවන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි. | 2023 වර්ෂය සඳහා නිකුත් කර ඇති මෙතෙක් පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම් 08 සඳහා කඩිනමින් පිළිතුරු ලබා දෙන ලෙසට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. | නියමිත කාලය තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දිය යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | (i) | ගැඹුරු මුහුදෙහි ධීවර කටයුතු සිදුකරන ධීවර යාත්‍රා නිරීක්ෂණය හා නියාමනය කිරීම සඳහා උපකරණ කට්ටල 4200 ක් ඕස්ට්‍රේලියානු රජය විසින් ප්‍රදානයක් වශයෙන් ලබා දී තිබූ අතර එම උපකරණ කට්ටලයක් එක් යාත්‍රාවක සවිකිරීමේ වියදම ඇමරිකානු ඩොලර් 45 ක් විය. එම මුදල උපකරණ කට්ටලයක් සවිකිරීමේ කොන්ත්‍රාත්තුව ලබා දී තිබූ දේශීය සමාගම වෙත ගෙවිය යුතුව ඇත. කෙසේ වුවද ටෙන්ඩර් නියමයන් අනුව යාත්‍රා නිරීක්ෂණ පද්ධති 200 ක් අදාළ සැපයුම්කරු විසින් බහුදින ධීවර යාත්‍රා 200 ක නොමිලේ සවිකළ යුතුය. කෙසේ වෙතත් 2020 දෙසැම්බර් 31 දිනෙන් පසු ලියාපදිංචි/නිෂ්පාදනය කරනු ලබන, බෝට්ටු සඳහා VMS උපකරණ අදාළ බෝට්ටු හිමිකරුවන් විසින් සවිකර ගත යුතු බවට රජය තීරණය කර තිබුණ ද ඉහත සඳහන් දිනට පසු ලියාපදිංචි කර තිබූ බෝට්ටු 27ක් සඳහා ද අදාළ යන්ත්‍ර නොමිලේ සවිකර තිබුණේ කෙසේ ද යන්න පිළිබඳව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණයක් සිදුකර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති 2020.12.31 න් පසුව ලියාපදිංචි කරන ලද යාත්‍රා 27 දෙපාර්තමේන්ත කළමනාකරණය විසින් ද හඳුනා ගන්නා ලද අතර මේ වන විට ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කරමින් පවතී. | VMS උපකරණ සවිකිරීම් සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | බහුදින ධීවර කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි බෝට්ටු ලැයිස්තුවේ ලියාපදිංචි දිනය සඳහන් කර නොමැති බෝට්ටු 60 ක් සඳහා VMS යන්ත්‍ර මුදල් අයකිරීමෙන් පසු සවිකර තිබුණි. එමෙන්ම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබීම නිසා මෙම බෝට්ටු 2020 දෙසැම්බර් 31 දිනෙන් පසු ලියාපදිංචි/නිෂ්පාදනය කරනු ලැබූ, බෝට්ටු ද යන්න තහවුරු කර ගැනීමක් සිදුකර නොතිබුණි. | මෙම ධීවර යාත්‍රා 60 ම 2020.12.31 දිනට පසුව මුල් ලියාපංචිය සිදු කරන ලද යාත්‍රා බව තහවුරු කර ගන්නා ලදී.ඒ අනුව මුදල් අය කර VMS යන්ත්‍ර සවි කිරීම නිවැරදි වේ. එමෙන්ම දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා 2024 වර්ෂයේ මුල් කාර්තුවේදී ධීවර යාත්‍රා ලියාපදිංචිය සිදු කරන කළමනාකරණ අංශය පවත්වාගෙන යන පොදු 62 ලේඛනය MSDFAR පද්ධතියට ඇතුලත් කරන ලදී.මේ වන විට දත්ත පද්ධතිය යාවත්කාලීනව පවතී. | දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (iii) | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පෞද්ගලික සමාගමක් විසින් මසුන් ඇල්ලීමේ කටයුතු සඳහා ගෙන්වා දික්ඕවිට වරායේ රඳවා තබා තිබුණු විදේශීය රටවලට අයත් ධීවර යාත්‍රා 18 ක් බහුදින ධීවර කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබුණි. එසේ වුවද එම යාත්‍රා දීර්ඝ කාලයක් තිස්සේ ධීවර කර්මාන්තයේ යෙදී නොතිබුණු අතර එම යාත්‍රා සඳහා VMS යන්ත්‍ර සවිකර නොතිබුණි. VMS පද්ධති සවිකර නොතිබූ මෙම යාත්‍රා අවස්ථා කීපයකදී වරායෙන් පිටතට ගැඹුරු මුහුදේ යාත්‍රා කර තිබුණ ද මෙම යාත්‍රාවල ගැඹුරු මුහුදේ යාත්‍රා කිරීම් පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. මේ අනුව දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අනෙකුත් බහුදින ධීවර යාත්‍රා සඳහා අදාළ වන නීතිමය තත්ත්වයෙන් බැහැරව කටයුතු කිරීමට පෞද්ගලික සමාගමකට අයත් විදේශීය බහුදින ධීවර යාත්‍රා සඳහා අවස්ථාව සලසා දීම තුළින් එම බහුදින ධීවර යාත්‍රාවල ධීවර කටයුතු පිළිබඳව දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය විගණනයේ දී ගැටලු සහගත විය. | මෙම යාත්‍රා ශ්‍රී ලංකාවට රැගෙන එන අවස්ථාව වන විටත් එම නැව් සමාගම් විසින් සවිකරන ලද VMS යන්ත්‍ර සහිත සැටලයිට් සම්බන්ධතා සක්‍රීයව තිබූ අතර එම යාත්‍රා අධීක්ෂණය කිරීමේ පහසුකම් සහ අධිකාරි බලය එම සමාගම් විසින් ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ යාත්‍රා නිරීක්ෂණ මධ්‍යස්ථානය වෙත ලබාදී තිබිණි. පැය විසි හතර පුරා එම යාත්‍රා අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය සිදුවූ අතර එම යාත්‍රාව විසින් රැගෙන එනු ලැබූ සියලුම මත්සයින් පිළිබඳ තොරතුරු චන්ද්‍රිකා දත්ත තොරතුරු මත පදනම්ව නීති විරෝධී ධීවර කටයුතුවලින් තොරව අල්ලාගන්නා ලද මසුන් බවට සත්‍යාපනය කිරීම සිදුකරන ලදී. කෙසේ වෙතත් ආර්ථික අර්බුදයක් සමඟ එම යාත්‍රාවලින් සිදුකර තිබූ ධීවර කටයුතු නැවති තිබූ බැවින් යාත්‍රා දීර්ඝ කාලයක සිට දික්ඕවිට වරායේ ගැටගසා තැබීමට සිදු වී ඇත. | විදේශීය ධීවර යාත්‍රාවල ධීවර මෙහෙයුම් කටයුතු පිළිබඳව නියාමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (iv) | අංක IMULA-0140-CBO යටතේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ විදේශීය බහුදින ධීවර යාත්‍රාව 2022 මැයි 19 දින දික්ඕවිට ධීවර වරායෙන් ධීවර කටයුතු සඳහා පිටත්ව ගොස් ඇති අතර නැවත 2022 ජූලි 04 දින වරායට ආපසු පැමිණ තිබුණි. එසේ වුවද ඊට අදාළ ලොග් සටහන් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබූ අතර දෙපාර්තමේන්තුව විසින් දික්ඕවිට කාර්යාලයේ බහුදින ධීවර යාත්‍රා නැවත පැමිණීමේ ලේඛනයේ ධීවර මෙහෙයුම් කටයුතු නොමැති (No Operation) ලෙස සටහන් තබා තිබුණි. මෙසේ දින 46 කට පසු ගැඹුරු මුහුදේ යාත්‍රා කිරීමෙන් ආපසු පැමිණ තිබූ ධීවර යාත්‍රාව සිදුකර තිබූ ධීවර කටයුතු මොනවාද යන්න පිළිබඳව දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයක් සිදු වී නොතිබුණි. | IMULA-0140-CBO ධීවර යාත්‍රාව 2022 මැයි මස 19 වන දින ධීවර මෙහෙයුම් සඳහා දික්ඕවිට ධීවර වරායේ දකුණු පර්යන්තයෙන් පිටත්ව ගොස් ආපසු යාත්‍රාව දික්ඕවිට වරාය වෙත 2022 ජුනි මස 24 වැනි දින නැවත වරායට පැමිණ ඇත. එහිදී යාත්‍රාව පිටත්වී දින දහයකට පමණ පසු යාත්‍රාවේ ඇති වූ කාර්මික දෝෂයක් නිසා මසුන් ඇල්ලීමකින් තොරව 2022 ජුනි 24 වන දින නැවත වරායට පැමිණ තිබුණි. දෙපාර්තමේන්තුවේ නිලධාරියා විසින් ලොග් පොත භාරගෙන 2022 ජූලි 04 වන දින යාත්‍රාව පැමිණිම සටහන් කරන ස්ථානයේ "යාත්‍රාව අකර්මණ්‍ය වීම හේතුවෙන් මාලු අල්ලා නොමැති බව" සටහන් තබා ඇත. | දෙපාර්තමේන්තුව විසින් මෙම ධීවර යාත්‍රාවල මෙහෙයුම් කටයුතු යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| (ආ) | (i) | 2016 දෙසැම්බර් 20 දිනැති අංක අමප/16/2547/725/020-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රජයේ සියයට 50 ක සහනාධාර යටතේ අඩි 55 කින් යුත් නවීන තාක්ෂණය සහිත ධීවර යාත්‍රා 10 ක් නිෂ්පාදනය සඳහා රු.මිලියන 130 ක් 2016 වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් කර තිබුණි. මෙම සහනාධාර ක්‍රමවේදය යටතේ, ඉදිකිරීම භාර දී තිබූ ධීවර යාත්‍රා 10 න් ධීවර යාත්‍රා 2 ක් විගණිත දින වන විට වසර 08 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද නිෂ්පාදන කටයුතු අවසන් කර එම හිමිකරුවන්ට භාර දීමට කටයුතු කර නොතිබුණ ද දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. | IMUL - A - 0061 KMN හා IMUL - A - 0062 KMN යන මෙම යාත්‍රා දෙකෙහි නිෂ්පාදනය 2016 වර්ෂය වන විට නිම කල යුතු වුවද විවිධ හේතූන් මත නිෂ්පාදනය සම්පූර්ණ කිරීමට නොහැකි වූ අතර පිළිවෙලින් 70% ක් හා 10% නිෂ්පාදනය කර තිබුණි. සීනෝර් ආයතනය, යාත්‍රා අංගනය හා බහු දින ධීවර යාත්‍රා හිමිකරු යන පාර්ශවයන් සමග සාකච්ඡා කරමින් කඩිනමින් යාත්‍රා දෙකෙහි නිෂ්පාදනය නිම කිරීමට කටයුතු කරමින් පවතී. | රජයේ අරමුණු ඉටුවන ලෙස යාත්‍රා ඉදිකිරීම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කළ යුතුය. |
| | (ii) | සියයට 50 රජයේ සහනාධාර ව්‍යාපෘතිය යටතේ ධීවර යාත්‍රා නිෂ්පාදනය කිරීම වෙනුවෙන් 2016 නොවැම්බර් 16 වන දින සිව් පාර්ශවීය ගිවිසුමක් දෙපාර්තමේන්තුව විසින් අත්සන් කර තිබුණ ද යාත්‍රා නිෂ්පාදනයේ දී සිදුවී තිබෙන කාල ප්‍රමාදය | සිව් පාර්ශවීය ගිවිසුම අඩුපාඩු සහිතව සකසා ඇති බව පිළිගනිමි. සීනෝර් ආයතනය, යාත්‍රා අංගනය හා බහු දින ධීවර යාත්‍රා හිමිකරු යන පාර්ශවයන් සම්බන්ධ කර ගෙන රජයට | මුදල් රෙගුලාසි ප්‍රකාරව සකසුරුවම්භාවය පිළිබඳ අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන ගිවිසුමට ඇතුළත් කර නොමැත. මේ අනුව රාජ්‍ය මුදල් වියදම් කිරීමේ දී ගණන්දීමේ නිලධාරි විසින් මුදල් රෙගුලාසි 156(7) ප්‍රකාරව සකසුරුවම්භාවය පිළිබඳ අවධානය යොමුකර වියදම් කළ යුතු බව පැහැදිලිව සඳහන්ව තිබුණ ද මෙම යාත්‍රා නිෂ්පාදනය පවත්වාගැනීම සඳහා ගෙවීම් කිරීමේ දී එකී විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | පාඩුවක් නොවන ආකාරයට කටයුතු කිරීම සඳහා දෙපාර්තමේන්තුව වර්තමානයේ ක්‍රියාත්මක වෙමින් පවතී. | |
| (ඇ) | සියයට 50 රජයේ සහනාධාර මත නිෂ්පාදනය කරන ලද අංක IMUL-A-0844 CHW දරන ධීවර යාත්‍රාව 2018 මාර්තු 22 දින සිදුකර තිබූ ප්‍රථම මුහුදු ගමනේදීම ගිනිගෙන විනාශ වී තිබුණි. ඒ අනුව සහනාධාර යටතේ ධීවර යාත්‍රා ලබාදීම තුළින් ගුණාත්මක දේශීය මත්ස්‍ය අස්වැන්න වැඩිකිරීමේ අමාත්‍ය මණ්ඩල අරමුණු ඉටු වී නොතිබුණි. කෙසේ වෙතත් එම යාත්‍රාව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණය කර තිබූ අතර විනාශයට පත්වූ යාත්‍රාව වෙනුවෙන් රු.29,138,241 වන්දි මුදලක් අනුමත වී තිබුණි. එම සම්පූර්ණ වන්දි මුදලම එම ධීවර යාත්‍රාව නිෂ්පාදනය කිරීම සඳහා සියයට 50 ක දායකත්වය ලබා දී තිබූ යාත්‍රා භාරකරුට ගෙවන ලෙස දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2018 අගෝස්තු 06 දින රක්ෂණ සංස්ථාව වෙත ලිපියක් මඟින් දන්වා යවා තිබුණි. මේ අනුව යාත්‍රාව නිෂ්පාදනය සඳහා රජය විසින් ගෙවා තිබූ රු.14,500,000 ක මුදල ආපසු අයකර ගැනීමක් සිදුකර නොතිබූ අතර එම මුදල ද යාත්‍රා භාරකරුට ලබාදීම තුළින් රජයට මූල්‍යමය අලාභයක් සිදුකර තිබේ. | 50% රජයේ සහනාධාරය මත නිපදවන ලද IMUL - A- 0844 CHW අංක දරන යාත්‍රාව ගිනි ගෙන විනාශ වීම හේතුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලද වන්දි මුදල එම යාත්‍රාවේ ප්‍රතිලාභියා වෙත ගෙවීමට කටයුතු කර තිබේ. | යාත්‍රාව ඉදිකිරීම සඳහා රජයේ ලබාදුන් දායකත්ව මුදල රජයට අහිමි කර තිබීම සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | කලපු සංවර්ධන වැඩසටහන යටතේ කලපු සීමා ලකුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ හලාවත කලපුවේ සීමා මායිම් සලකුණු කිරීම සඳහා අවශ්‍ය සීමා මායිම් කණු සංඛ්‍යාව 1,784 ක් වුවද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී කණු සංඛ්‍යාව 4060 ක් ලෙස සටහන්වීම නිසා වැඩිපුර සාදා නිමකර තිබුණු රු.3,826,639 ක්වූ කණු 2276 ක් 2023 දෙසැම්බර් 31 දිනවන විටත් හලාවත කලපුවේ ස්ථාන 13 ක ගොඩගසා තිබුණි. මුදල් රෙගුලාසි 128(1)(එ) ප්‍රකාර මහජන මුදල් වියදම් කිරීමේ දී අරපිරිමැස්ම සහ කාර්යක්ෂමතාවය, විධිමත් බව සහ අවංකභාවය පිළිබඳව ගණන්දීමේ නිලධාරීන් | ඇස්තමේන්තු සකස් කිරීමේ දී සිදු වී තිබූ ප්‍රමාද දෝෂයන් නිසා වැඩිපුර මිලදීගෙන තිබූ කණු 2276 ක් පුත්තලම කලපුව වෙත නැවත ප්‍රවාහනය කර පුත්තලම කලපුවේ සීමා ලකුණු කිරීම සඳහා යොදා ගැනීමට නියමිතව ඇත. | වැඩිපුර මිලදී ගත් කණුවල වියදම සහ අමතරව දැරීමට සිදුවන ප්‍රවාහන වියදම් වගකිව යුතු පාර්ශව වෙතින් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වගකිව යුතුව තිබෙන බව සඳහන්ව තිබුණ ද, ඒ පිළිබඳව සැලකිලිමත් වී නොතිබුණි. | | |
| (ඉ) | ආරුගම්බේ කලපුවේ සීමා ලකුණු කිරීම සඳහා මායිම් කණු 1048 ක් නිෂ්පාදනය කර තිබුණ ද මායිම් කණු 420 ක් කලපුව වටා ස්ථාපිත කර තිබූ අතර ඉන් මායිම් කණු 90 ක් හඳුනානොගත් අයවලුන් විසින් ගලවා ඉවත්කර ඇති බව දන්වා තිබුණි. මායිම් කණු 90 ක් ඉදිකිරීමට හා ස්ථාපිත කිරීමට දළ වශයෙන් රු.222,300 ක මුදලක් රජයට වැය වී තිබූ අතර එම හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තව ද, එම ගලවා ඉවත්කර තිබූ මායිම් කණු සඳහා නැවත කණු ස්ථාපිත කිරීම සහ ඉතිරිව තිබූ මායිම් කණු 628 ක ප්‍රමාණයක් කලපු සීමා සලකුණු කිරීම සඳහා ස්ථාපිත කිරීම 2023 දෙසැම්බර් 31 දිනවන විටත් සිදුකර නොතිබුණි. | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ආරුගම්බේ කලපුවේ මායිම් කණු 420 ක් සිටුවා ඇති අතර, මෙම මායිම් කණු අතරින් කණු 90 ක් නාඳුනන පුද්ගලයන් විසින් ගලවා ඉවත් කර ඇත. මේ සම්බන්ධයෙන් පොතුවිල් පොලිස් ස්ථානයේ 2020.09.18 දින පැමිණිල්ලක් සිදු කර ඇත. | රජයට සිදු වී තිබෙන පාඩුව අයකරගත යුතු අතර ඉතිරි කණු කලපු සීමා ලකුණු කිරීමට යොදා ගත යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්ක/අරමුණු හඳුනාගැනීමේ දී ඒවා නිශ්චිත සහ මැනිය හැකි ආකාරයෙන් හඳුනාගෙන නොතිබුණු අතර ජයග්‍රහණ දර්ශක සංඛ්‍යාත්මකව හඳුනාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගත යුතු අතර ජයග්‍රහණ දර්ශක හඳුනාගෙන තිබිය යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 කට අදාළව පුරප්පාඩු 19 ක් ද, තෘතියික මට්ටමේ තනතුරු 02 කට අදාළව පුරප්පාඩු 10 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 08 කට අදාළව පුරප්පාඩු 223 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 කට අදාළව පුරප්පාඩු 05 ක් ද පැවතුණි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටම ඇතුළුව තනතුරු විශාල සංඛ්‍යාවක් පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටුකිරීමේ දී බාධාවක් වී තිබුණි. | පත්වීම් සිදු කිරීමට සහ බඳවාගැනීම් සඳහා විභාග පැවැත්වීමට කටයුතු කරමින් පවතී. වෙනත් නිලධාරීන් විසින් අදාල තනතුරු වල රාජකාරි ඉටුකරමින් පවතී. | දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගත යුතුයි. |